ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date. 2025.06.17

පැමිණිලිකාර පාර්ශවය : එච්.ඒ.ආර්.ටී.එස්. හපුගලආරච්චි මිය.
290/2,
උල්ලලපොල,
දිවුලපිටිය.

වගඋත්තරකාර පාර්ශවය 01 සභාපති,
ගුවන් තොටුපල හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම,
බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපල,
කටුනායක.

02 ආර්.ඒ.එම්.එස්.ආර්. උඩුගම්පොල මිය,
ගුවන් තොටුපල හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම,
බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපල,
කටුනායක.

පැමිණිලි අංකය : **HRC/HO/4568/23**

**පැමිණිල්ල :**

උක්ත පැමිණිලිකාරිය විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ ගුවන් තොටුපල හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම තුල පවත්වන ලැබූ ගුවන් තොටුපල සේවා සහායිකා තනතුර සඳහා බඳවා ගැනීමේ දී සිදු වී ඇති අක්‍රමතාවයක් ලෙස සඳහන් කර ඇත්තේ එම පවත්වනු ලැබූ සම්මුඛ පරීක්ෂණයේ දී පැමිණිලිකාරිය හට ලබා දී ඇති ලකුණු සංඛ්‍යාව ඇයගේ සුදුසුකම් අනුව නිසි පරිදි ලබාදී නොමැති බවත් අවශ්‍ය සුදුසුකම් නිසි පරිදි සපුරා නොමැති අයදුම්කාරියක් වන ආර්.එම්.එස්.ආර්.උඩුගම්පල යන අය වෙත සම්මුඛ පරීක්ෂණයේ දී ඉහළ ලකුණු ලබා දී තනතුරු සඳහා පත්වීම් ලබා දීම සිදු කර ඇති බවයි. එසේ සුදුසුකම් නොලත් අය පත්කිරීම් තුලින් නිසි ලෙස සුදුසුකම් සපුරා ඇති අයදුම්කාරියකු වන තමාගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝණය වී ඇති බවයි.



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: අංක. 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / இல. 14, ஆர்.ஏ.த.மெல் மாவத்தை, கொழும்பு - 04. / No. 14, R.A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairman: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541/74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone: 94-11-2505580 / 81 / 82
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

**වගඋත්තරකරුගේ කරුණු දැක්වීම**

මේ සම්බන්ධව වගඋත්තරකාර පාර්ශවය විසින් මෙම කොමිෂන් සභාව වෙත වාර්තා කර ඇත්තේ එම සමාගමේ පවත්වන ඉහත කී තනතුරට අදාල පුරප්පාඩු පිරවීම සඳහා ආයතනය තුල පවතින අනුමත බඳවා ගැනීම් හා උසස් කිරිමේ පටිපාටිය අනුව 2022.10.12 දින අයදුම්පත් කැඳවූ බවත්, ඒ අනුව එකී තනතුර සඳහා,

1. අයදුම්පත් කැඳවන අවසන් දිනය වන විට ගුවන් තොටුපොල සේවා නිලධාරි තනතුරේ වසර 3ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

2. පිළිගත් ආයතනයකින් පරිඝණක පාඨමාලාවක් ( අවම වශයෙන් මාස 03 ) සම්පූර්ණ කර තිබීම හා සුදුසුකම් අවශ්‍ය කර තිබුණු බවත්ය.

ඒ අනුව එකී තනතුර සඳහා අයදුම්පත් 61ක් ලැබුණු අතර එයින් 35 දෙනෙක් ලිඛිත පරික්ෂණය සඳහා සුදුසුකම් ලද බවත්, ඒ සඳහා 29 දෙනෙකු සහභාගී වූ අතර 28 දෙනෙකු ලිඛිත පරික්ෂණයෙන් සමත් වූ බවත්, 2023.09.14 වන දින පවත්වන ලද සම්මුඛ පරික්ෂණය සඳහා 26 දෙනෙකු සහභාගී වූ බවත්, ජ්‍යෙෂ්ඨත්වය මෙන්ම පහත සඳහන් අනෙකුත් නිර්ණායකයන් ද සලකා බැලූ බවත්,

| | විෂය | ලකුණු |
|---|---|---|
| 1 | රාජකාරිය පිළිබඳ දැනුම | 20 |
| 2 | ජ්‍යෙෂ්ඨත්වය | 20 |
| 3 | නිවාඩු හා පැමිණීම | 10 |
| 4 | ආයතනය පිළිබඳ සාමන්‍ය දැනීම | 10 |
| 5 | පෞර්ෂත්වය | 10 |
| 6 | සන්න්වේදන හැකියාව | 20 |
| 7 | අදාළ වෙනත් සුදුසුකම් | 10 |
| මුළු ලකුණු එකතුව | | 100 |

උක්ත පැමිණිලිකාරියට වසර 29 මාස 01 දින 25 ක සේවා කාලයක් 2022.10.26 දින වන විට තිබූ අතර සම්පූර්ණ කර ඇති අතර ඇයට ඒ සඳහා ලකුණු 18.01 ක් ලබා දී ඇති බවත්, නිවාඩු සහ පැමිණීම යන නිර්ණායක සඳහා ලකුණු ලබා දීමේ දී සම්මුඛ පරික්ෂණය පවත්වන වසරට පෙර වසර 2කදී එනම් 2021 සහ 2022 යන වර්ෂ වලදී අයදුම්කරුවන් විසින් ලබා ගත් වාර්ෂික හා අසනීප නිවාඩු සලකා බලා ඇති බවත් ඒ අනුව උක්ත පැමිණිලිකාරිය 2021 වර්ෂයේ දී නිවාඩු 35 ක් සහ 2022 වර්ෂයේ දී නිවාඩු 35 ක් ලබා ගෙන ඇති අතර එම දෙවසර තුළ ඇය විසින් ලබා ගත් සාමාන්‍ය නිවාඩු ප්‍රමාණය නිවාඩු 35 ක් වන බවත් ඒ සඳහා ඇයට ලකුණු 1.5 ක් ලබාදී ඇති බවත් වැඩිදුරටත් සඳහන් කර ඇත.

තවද අදාළ වෙනත් සුදුසුකම් සහ නිර්ණායකයන් සඳහා මෙම පැමිණිලිකාරිය වෙත භාෂා නිපුණත්ව පාඨමාලාව සඳහා ලකුණු 3 ක් සහ ආයතනය මගින් ලබා දී ඇති පුහුණු පාඨමාලා සඳහා ලකුණු 2.5 ක් සමග මුලු ලකුණු 5.5 ලබා දී ඇති බවයි.

අයදුම්පත්‍ර කැඳවීමේ අවශ්‍ය සුදුසුකම් ලෙස අවම වශයෙන් මාස 3 ක පරිසණක පාඨමාලාවක් තිබිය යුතු බව සඳහන් කර තිබූ අතර එම සුදුසුකම සපුරා නොතිබීම මත ප්‍රතික්ෂේප වූ අයදුම්කරුවන්ට ඒ පිළිබඳව ලිපි මඟින් 2023.04.04 දිනැති ලිපිය මඟින් දැනුවත් කර තිබූ බවත් එසේ ප්‍රතික්ෂේපිත අයදුම්කරුවකු වූ ආර්.ඒ.එම්.එස්.ආර්. උඩුගම්පල මහත්මිය විසින් ඉහත කී දැනුම් දීමෙන් අනතුරුව පරිසණක පාඨමාලාව සිදු කළ බව සනාථ කරමින් අදාළ සහතික පත්‍රය සමඟ 2023.04.18 වන දින ගුවන් තොටුපල මානව සම්පත් කළමනාකරණ ප්‍රධානි මඟින් මානව සම්පත් අංශය වෙත යොමු කර තිබූ බවත් එකී සහතිකය ඇය විසින් 2003 වර්ෂයේ දී සම්පූර්ණ කරන ලද පාඨමාලාවක් වන බැවින් ඇය ඉහත තනතුරු සඳහා සුදුසුකම් සපුරා තිබූ අයදුම්කරුවකු ලෙස සලකා කටයුතු කර ඇති බවට වාර්තා තුලින් සඳහන් කර ඇත.

ඒ අනුව ඉහත කී නිර්ණායකවලට අනුව උඩුගම්පොල මහත්මිය විසින් එම සම්මුඛ පරීක්ෂණයේ දී 67.79 ක ලකුණු ප්‍රමාණයක් හා ලකුණු ලබා දී ඇති පිළිවෙල අනුව 15 වන ස්ථානය හිමි කරගෙන තනතුරට තෝරාපත් කරගෙන ඇති බවට දන්වා ඇත.

නමුත් ඉහත පැමිණිලිකාරිය විසින් ලබා ගෙන ඇති මුළු ලකුණු සංඛ්‍යාව 55.01 ක් හා අයදුම්කරුවන්ගේ ලකුණු ලබා ගැනීමේ ලේඛනය තුළ ලබා ගෙන ඇති ලකුණු සංඛ්‍යාව අනුව ඇය 24 වන ස්ථානය ලබා ගෙන ඇති බැවින් පළමු ලකුණු ලබා ගත් 20 දෙනා අතරට පැමිණ නැත. එබැවින් මෙම සම්මුඛ පරීක්ෂණයේ දී තෝරාපත් කර ගෙන ඇත්තේ තනතුරු 20 ක් සඳහා පමණක් බැවින් මෙම පැමිණිලිකාරිය එකී තනතුරු සඳහා තෝරා පත් කරගෙන නොමැති බවයි.

මෙම පැමිණිල්ලට අදාළව වගඋත්තරකරුවෙක් ලෙස නම් කර ඇති ආර්.ඒ.එම්.එස්.ආර්. උඩුගම්පොල යන අය වෙත සභාපති, ගුවන් තොටුපල හා ගුවන් සේවා ආයතනය මගින් කොමිෂන් සභාව හමුවේ පෙනී සිටින ලෙසට සිතාසි නිකුත් කර ඇති නමුත් ඇය 2025.05.08 දින පැවති පරීක්ෂණ කටයුතු සඳහා සහභාගි වී නොමැති අතර ඒ පිළිබඳව කිසිදු කරුණු දැක්වීමක් ද සිදුකර නොමැත.

<u>නිරීක්ෂණ</u>

1. පැමිණිලිකාරිය විසින් පැමිණිලි ලේඛනය මඟින් සඳහන් කර ඇති උක්ත තනතුර සඳහා බඳවා ගැනීමේ ක්‍රියාවලියේ දී මූලික සුදුසුකම් ලෙස අයතනය තුල පවතින අනුමත බඳවා ගැනීම් ක්‍රියාපටිපාටියට අනුව පහත සුදුසුකම් සළකා බලා ඇති බවට නිරීක්ෂණය වේ.

    I. අයදුම්පත් කැඳවන අවසන් දින වන විට ගුවන් තොටුපල සේවා නිලධාරි තනතුරේ වසර 3ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම. සහ

    II. පිළිගත ආයතනයකින් පරිගණක පාඨමාලාවක් ( අවම වශයෙන් මාස 03ක් ) සම්පූර්ණ කර තිබීම.

ඒ අනුව ඉහතින් දක්වන ලද මූලික නිර්ණායකයන් අනුව සෑම අයදුම්කරුවකුම පුරප්පාඩු කැඳවනු ලබන අවස්ථාව වන විට එකී නිර්ණායකයන් සපුරා තිබිය යුතු වේ. කෙසේ නමුත් එහි දෙවන මූලික සුදුසුකම වන පරිසණක පාඨමාලාවක් සම්පූර්ණ කර තිබීම යන සුදුසුකම සලකා බැලීමේදී පැමිණිල්ලේ සඳහන් වන පරිදි ආර්.ඒ.එම්.එස්.ආර්. උඩුගම්පල යන අය විසින් පුරප්පාඩු කැඳවන අවස්ථාව වන විට එම සුදුසුකමට අදාළ වූ සහතික පත්‍රයක් ඉදිරිපත් කර නොතිබූ බව නිරීක්ෂණය වේ. එහිදී වගඋත්තරකාර පාර්ශවය විසින් 2023.04.04 දිනැතිව නිකුත් කර ඇති උක්ත තනතුර සඳහා වන පරිසණක පාඨමාලාව සම්පූර්ණ නොකිරීම හේතුවෙන් සුදුසුකම් සපුරා නොමැති අයදුම්කරුවන්ගේ නම් ලැයිස්තුවක් නිකුත් කර ඇති අතර ඉහත කී උඩුගම්පල යන අයගේ නම ද එහි ඇතුළත්ව තිබුණු බවට නිරීක්ෂණය වේ.

තවද ඉහත පැමිණිලිකාරිය විසින් මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති ලේඛනයක් වන 2022.12.02 දින දරණ උප සභාපති වෙත එම ආයතනයේ නිලධාරීන් 14 දෙනෙකු විසින් අත්සන් කර " POST OF ASSISTANT SUPERINTENDENT" යන ශිර්ෂය යටතේ ඉදිරිපත් කර ඇති ලිපිය සලකා බැලීමේ දී එහි සඳහන් අන්තර්ගතය වන්නේ එම ලිපියට අත්සන් කරන ලද නිලධාරීන් පිරිස වෙත මෙම තනතුරට අදාළ මූලික සුදුසුකමක් වන පරිගණක සහතිකය සැලකිල්ලට නොගෙන ඔවුන්ගේ පරිගණක භාවිතය සම්බන්ධව සේවා අත්දැකීම් හා පළපුරුද්ද සලකා බලා අයදුම්පත් පිළි ගන්නා ලෙසට ඉල්ලීමක් කර ඇති බවයි.

කෙසේ වුවද වගඋත්තරකාර පාර්ශවය සඳහන් කර ඇත්තේ ඉහත කී 2023.04.04 දිනැති ලිපිය මඟින් ප්‍රතික්ෂේප වූ අයදුම්කරුවන් වෙත ඒ පිළිබඳව දැනුම් දීමෙන් අනතුරුව උඩුගම්පල යන අය විසින් 2003 වර්ෂයේ දී සම්පූර්ණ කරන ලද පාඨමාලාවකට අදාල සහතික පත්‍රයක් 2023.04.18 දින ඉදිරිපත් කිරීම හේතුවෙන් උක්ත තනතුර සඳහා ඉල්ලුම් කිරීමට හැකියාව තිබූ බවයි.

කෙසේ වුව ද වගඋත්තරකාර පාර්ශවය විසින් අයදුම්පත් කැඳවූ අවස්ථාවේ දී උඩුගම්පොල යන අය විසින් පරිගණක පාඨමාලාට අදාලව සහතිකය ඉදිරිපත් කිරීමට නොහැකි වූ අයදුම්කරුවන් 14 දෙනෙකු එම සුදුසුකම සපුරා නොතිබීම මත එය නොසලකා හැර සේවා අත්දැකීම් හා පළපුරුද්ද සලකා බලා මෙම තනතුරු සඳහා බඳවා ගන්නා ලෙසට ඉල්ලීමක් කර ඇත. එයට 2022.12.02 දිනැති ලිපිය මඟිනි. එම ලිපිය සඳහා ඉහත කී උඩුගම්පිල යන අයකු අත්සන් තබා ඇත.

ඒ අනුව 2023.02.02 වන දිනය වන විට ඇය එම සුදුසුකම සපුරා තිබේ නම් එවැනි ලිපියක් සඳහා අත්සන් කිරීමට කිසිදු අවශ්‍යතාවයක් නොමැති අතර ඉහත තනතුර සඳහා අයදුම් පත් කැඳවූ අවස්ථාවේදිම එකී සහතික පත්‍රය ඉදිරිපත් කිරීමට ඇයට අවස්ථාවක් තිබුණ නමුත් එසේ ඉදිරිපත් නොකර පසුව ඉදිරිපත් කර ඇති බවට නිරීක්ෂණය වේ.

ඉහත තනතුර සඳහා වගඋත්තරකාර පාර්ශවය විසින් පවත්වන ලද සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ලබා දී ඇති නිර්ණායකයන් පහත පරිදි වේ.

| | විෂය | ලකුණු |
|---|---|---|
| 1 | රාජකාරිය පිළිබඳ දැනුම | 20 |
| 2 | ජ්‍යෙෂ්ඨත්වය | 20 |
| 3 | නිවාඩු හා පැමිණීම | 10 |
| 4 | ආයතනය පිළිබඳ සාමාන්‍ය දැනීම | 10 |
| 5 | පෞර්ෂත්වය | 10 |
| 6 | සන්නිවේදන හැකියාව | 20 |
| 7 | අදාළ වෙනත් සුදුසුකම් | 10 |
| මුළු ලකුණු එකතුව | | 100 |

මේ අතරින් මෙම කොමිෂන් සභාව විසින් සලකා බැලීමට හැකි වන්නේ ජ්‍යෙෂ්ඨත්වය, නිවාඩු හා පැමිණීම සහ අදාළ වෙනත් සුදුසුකම් යන නිර්ණායකයන් පමණි. එම නිර්ණායකයන් සඳහා ලබා දී ඇති ලකුණු සම්බන්ධව පැමිණිලි පාර්ශවය විසින් හබ කිරීමක් සිදු කර නොමැත. එහිදී වගඋත්තරකාර

පාර්ශවය විසින් සම්මුඛ පරීක්ෂණයේ දී උක්ත පැමිණිලිකාරිය වෙත ජ්‍යෙෂ්ඨත්වය යන නිර්ණායකය පදනම්ව ලකුණු ලබා දී ඇත්තේ ඇය එකී ආයතනයේ සේවය ලබා දුන් කාලය පදනම් කොටගෙන බව නිරීක්ෂණය වේ. එහිදි ඇයට වඩා වැඩි සේවා කාලය සපුරා ඇති අයදුම්කරුවන් හට වැඩි ලකුණු ප්‍රමාණයක් සහ ඇයට වඩා අඩු සේවා කාලයක් සපුරා ඇති අයදුම්කරුවන් හට ඇයට වඩා අඩු ලකුණු ප්‍රමාණයක් ලබා දී ඇති බවට වගඋත්තරකරු විසින් මෙම කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති ලකුණු ලැයිස්තුව සළකා බැලීමේ දී නිරීක්ෂණය වේ. ඒ අනුව නිරීක්ෂණය වන්නේ ජ්‍යෙෂ්ඨත්වය සඳහා ලකුණු ලබා දීමේ දී උක්ත පැමිණිලිකාරියගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝණය වී ඇති බවට කරුණු අනාවරණය නොවේ.

නිවාඩු හා පැමිණීම යන නිර්ණායකය සඳහා ලකුණු ලබා දීමේ දී වගඋත්තරකාර පාර්ශවය විසින් සලකා ඇත්තේ,

| Avg. leave taken | Marks out of 20 | Marks out of 10 |
|---|---|---|
| 0 - 5 | 20 | 10 |
| 6 - 10 | 18 | 9 |
| 11 - 15 | 15 | 7.5 |
| 16 - 20 | 12 | 6 |
| 21 - 25 | 9 | 4.5 |
| 26 - 30 | 6 | 3 |
| 31 - 35 | 3 | 1.5 |
| More than 35 | 0 | 0 |

ඉහත තනතුරු සඳහා අයදුම්පත් ඉදිරිපත් කිරීමට නියමිතව තිබූ අවසන් දිනයට පෙර වර්ෂ දෙකකදී ලබා ගන්නා ලද සම්පූර්ණ නිවාඩු වල සාමාන්‍ය නිවාඩු ප්‍රමාණය සළකා බලා ඇති බවත් ඒ අනුව පැමිණිලිකාරිය විසින් වර්ෂ දෙකක් තුළදී නිවාඩු 63 ½ ක් ලබා ගැනීම මත ඊට අදාළ සමාන්‍ය නිවාඩු ප්‍රමාණය 31.75 සඳහා 1.5ක ලකුණු ප්‍රමාණය ලබා ගෙන ඇති බව නිරීක්ෂණය වේ. එහිදි නිවාඩු දින සාමාන්‍ය 10.25 ක් ලබා ගත් අයදුම්කරුවන් හට ලකුණු 9ක් ලබා දී ඇත. ඒ අනුව නිරීක්ෂණය වන්නේ නිවාඩු සහ පැමිණීම සඳහා ලකුණු ලබා දීමේදි උක්ත පැමිණිලිකාරිය හට අගතියක් සිදු වී ඇති බවට කරුණු අනාවරණය නොවේ.

මෙහිදි සම්මුඛ පරීක්ෂණය තුළදී ඉහතින් සඳහන් කළ නිර්ණායකයන් 07 ට අනුව අයදුම්කරුවන්ට ආයතනය පිළිබඳව සාමාන්‍ය දැනීම, පෞර්ෂයත්වය , සන්නිවේදන හැකියාව යන නිර්ණායකයන් සඳහා ලකුණු ලබා දී ඇත්තේ සම්මුඛ පරීක්ෂණය සිදු කළ නිලධාරීන් විසින් එම පරීක්ෂණ අවස්ථාවේ අදාළ අයදුම්කරුවන් ඊට මුහුණ දුන් ආකාරය අනුව බව නිරීක්ෂනය වන බැවින් එම අවස්ථාවේ එම ලකුණු ලබා දීමේ පූර්ණ බලය හිමි වන්නේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට වේ. එබැවින් මෙම නිර්ණායකයන් සම්බන්ධව ලකුණු ලබාදීම තුළ පැමිණිලිකාරියගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝණය වී තිබේද යන්න සළකා බැලීමට හැකියාවක් නොමැති බවට නිරීක්ෂණය වේ.

වගඋත්තරකාර පාර්ශවය විසින් මෙම කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති 2024.07.23 දිනැති ලිපියට අමුණා ඇති ගුවන්තොටුපල හා ගුවන්සේවා පුද්ගලික සමාගමේ 2024.03.28 දිනැති අභ්‍යන්තර විගණන පරීක්ෂණ වාර්තාව තුළ පහත සඳහන් කරුණු ඇතුලත් කර ඇත.

(i) ගුවන් තොටුපල සේවා අධිකාර තනතුරට උසස් කිරීම සඳහා බඳවාගැනීම් හා උසස්කිරීම් පටිපාටිය අනුව අභිමතාර්ත හා සුදුසුකම් හා පරිගණක පාඨමාලාව සම්පූර්ණ නොකරන ලද නිලධාරීන් 22 කින් සමන්විත නාම ලේඛනයක් HR/619/15/290/Rect දරණ හා 2023.04.04 දිනැති මානව සම්පත් කළමණාකරුගේ අත්සනින් යුක්ත ලිපිය මගින් ප්‍රකාශයට පත් කර තිබුණු බවත්, එම ලිපියෙහි නම සඳහන් කරන ලද නිලධාරියාගේ මෙම තනතුර සඳහා සුදුසුකම් නොලත් නිලධාරීන් ගේ නම් දක්වා තිබියදී උක්ත නාම ලේඛනයේ සේවා අංක 4080 දරණආර්.ඒ.එම්.එස්.ආර්.උඩුගම්පොල යන නිලධාරියා 2023.10.03 වන දින මෙම තනතුරේ උසස් වීමේ නාම ලේඛනය අනුව සුදුසුකම් ලත් නිලධාරියෙකු ලෙස තෝරාගෙන ඇති බව අනාවරණය කරගෙන ඇති බව,

(ii) ඉහත කී තනතුර සඳහා පවත්වන ලද සම්මුඛ පරීක්ෂණයේ, සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ, සභාපතිගේ අංක HR/619/15/290/Ret හා 2023.09.19 දිනැති ලිපිය මගින් පත් කර තිබීම තුලින් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක සභාපති ඇතුලත්ව සාමාජිකයින් ඔත්තේ සංඛ්‍යාවක් විය යුතු වුවත්, ඉරට්ටේ සංඛ්‍යාවක් පත්කර තිබුණු බව,

(iii) සම්මුඛ පරීක්ෂණයේදී, ලකුණු ලබා දී ඇති නිර්ණායකයන් අනුව, නිලධාරීන්ගේ පවතින සුදුසුකම් හා තොරතුරු පදනම්වූ පරිදි ලකුණු 40ක්ද අයදුම්කරු සම්මුඛ පරීක්ෂණයට මුහුණ දෙන ආකාරය අනුව සම්මුක පරීක්ෂණ මණ්ඩලයේ අභිමතය පරිදි ලකුණු 60ක් ලබා දීමේ ක්‍රමවේදය සකස්ව තිබූ බවට සම්මුඛ පරීක්ෂණයේ ලකුණු ලබා දීමේ ක්‍රමවේදය නිර්ණායක 7ක් සඳහා ලකුණු ලබා දි ඇති අතර ඉන් 4ක් සම්මුඛ පරීක්ෂණයට මුහුණ දෙන ආකාරය අනුව පරීක්ෂණ මණ්ඩලයේ අභිමතය පරිදි ලකුණු ලබා දීමට අවස්ථාව ලබා දී ඇති බවත්, ඒ අනුව පරීක්ෂණයේදී ලබා දෙනු ලබන ලකුණු සංඛ්‍යාවෙන් මණ්ඩලය විසින් ලබා දෙනු ලබන ලකුණු බැවින් සම්මුඛ පරීක්ෂණය මගින් ලබා දෙන ලකුණු සඳහා පරීක්ෂණ මණ්ඩලයට වැඩි බලපෑමක් සිදු කල හැකි බැවින් ලකුණු ලබා දීමේ ක්‍රමවේදය තවදුරටත් සාධාරණ ලෙස අයදුම්කරුවන්ට ලකුණු හිමිවන ක්‍රමවේදයට පරිවර්තනය විය යුතු බවට නිර්දේශ කර ඇති බව.

(iv) එකී තනතුරු සඳහා තෝරා පත් කර ගැනීමේ සම්මුඛ පරීක්ෂණයේදී ජ්‍යෙෂ්ඨත්වය සඳහා ලකුණු ලබා දීමේදී වැඩි අවධානයක් යොමු කිරීම වඩා වැදගත් වන බැවින් සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු 30ට වැඩි ප්‍රමාණයක් ලබා දීම සුදුසු බව නිර්දේශ කර ඇති බව.

(v) ඉහත කී ආයතනයේ මානව සම්පත් කළමණාකරුගේ අංක HR/619/15/290/Rect හා 2023.04.04 විනැති ලිපිය අනුව සුදුසුකම් නොලත් නිලධාරියකු ලෙස නම්කර ඇති R.M.S.R.උඩුලම්පොල යන නිලධාරියාගේ පරිගණක සහතික පත්‍රය හා එම සහතිකය නිකුත් කල ආයතනයේ වලංගුභාවය පිලිබඳව සෑහීමකට පත්විය නොහැකි බවත්, ඒ සම්බන්ධයෙන් වැඩිදුර පරීක්ෂා කළ යුතු බව.

(vi) සම්මුඛ පරීක්ෂණයේදී රාජකාරිය පිලිබඳ දැනුම/ආයතනය පිලිබඳ සාමාන්‍ය දැනුම යන අංශ ලිඛිත පරීක්ෂණයෙන්ද පරීක්ෂා කර ඇති බැවින් සම්මුඛ පරීක්ෂණය තුලදීද එම නිර්ණායකයන් නැවත වාරයක් පරීක්ෂාවට ලක්කොට ලකුණු 30 වැනි ඉහළ ලකුණු ප්‍රමාණයක් නැවත ලබා දීම සාධාරණ ලකුණු ලබා දීමක් නොවන බව.

උක්ත සඳහන් ආයතනය තුල පවත්වන ලද ලකුණු සම්මුඛ පරීක්ෂණයට අදාලව එකී ආයතනයේ අභ්‍යන්තර විගණන අංශය මගින් ඉදිරිපත් කර ඇති විගණන වාර්තාවේ අන්තර්ගත කරුණු අනුව නිරීක්ෂණය වන්නේ සම්මුඛ පරීක්ෂණ ක්‍රමවේදය තුල ලකුණු ලබා දීමේදී ක්‍රමවේදයෙහි ගැටළුවක් පවතින බවයි. එනම්, සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබා දී ඇති නිර්ණායකයන් 7න් 4ක්ම පරීක්ෂණ මණ්ඩලයේ තීරණය මත ලකුණු ලබා දී ඇති බැවින් කිසියම් අයදුම්කරුවෙකු හට සම්මුඛ පරීක්ෂණයේ දී අගතියක් සිදු වීමට හැකියාවක් පවතින බවට නිරීක්ෂණය වේ. එසේම එකී සම්මුඛ පරීක්ෂණයේ දී නිර්ණායකයන් 4 ක් සඳහා ලකුණු 60 ක් වෙන් කිරීම මගින් යම්කිසි අයදුම්කරුවෙකු හට පරීක්ෂණ මණ්ඩලයේ නිලධාරීන්ගේ පෞද්ගලික හේතූන් මත ලකුණු ලබාදීමේදී කිසියම් අක්‍රමිකතාවයක් සිදුවීමට වැඩි ඉඩකඩක් පවතින බවද නිරීක්ෂණය වේ.

තවද, ඉහත සඳහන් සම්මුඛ පරීක්ෂණ ක්‍රමවේදය තුලදී සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක සිටිය යුතු නියමිත නිලධාරීන් සංඛ්‍යාව පවත්වා නොගෙන ඇති බවට ඉහත සඳහන් විගණන වාර්තාවේ සඳහන් කරුණු වලින් අනාවරණය වන බැවින් එවැනි සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් නොමැතිව පවත්වන ලද ඉහත කී සම්මුඛ පරීක්ෂණය මගින් විධිමත් සම්මුඛ පරීක්ෂණ ක්‍රියාවලියක් සිදුව නොමැති බව වැඩිදුරටත් නිරීක්ෂණය වේ.

සම්මුඛ පරීක්ෂණයට පෙර ලිඛිත විභාගයන් පවත්වා එහිදි රාජකාරී ආයතනය පිලිබඳ දැනුම පරීක්ෂා කොට ඇති අතර එසේ තිබියදී සම්මුඛ පරීක්ෂණය තුලදීද රාජකාරී පිලිබඳ දැනුම/ ආයතනය පිලිබඳ දැනුම ඉතා කෙටි කාලයක් තුළ නැවත පරීක්ෂා කිරීමක් සිදු කොට නැවත ඒ සඳහාම ලකුණු 30 වැනි ඉහළ ලකුණු ප්‍රමාණයක් ලබා දීම සාධාරණ ද යන්න හා එය ලබාදීමේ නිර්නායකය කුමක්ද යන්න ගැටලු සහගතය.

<u>නිගමනය :</u>

ඉහත සඳහන් කරුණු හා නිරීක්ෂණයන් සලකා බැලීමේදී අදාල සම්මුඛ පරීක්ෂණය තුලදී අනුගමනය කර ඇති ක්‍රමවේදය අවිධිමත් බව හා අගතිගාමී බවට නිගමනය කෙරේ.

තවද, සම්මුඛ පරීක්ෂණ තුලදී ලකුණු ලබා දුන් එක් එක් නිර්නායකයන් සඳහා වෙන් කර ඇති ලකුණු ප්‍රමාණය සාධාරණ පදනමක් මත හා නීත්‍යානුකූල පදනමක් මත සිදුකර නොමැති බවද පැහැදිලි වේ.

<u>නිර්දේශය</u>

01 ඉදිරියට වගඋත්තරකාර ආයතනය විසින් පවත්වනු ලබන සියලුම සම්මුඛ පරීක්ෂණ ලකුණු ලබාදීමේ විධිමත් පටිපාටියක් සහිතව සිදු කළයුතු වන අතර එසේම සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වීමේදී සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක සිටිය යුතු නියමිත සාමාජික සංඛ්‍යාව පවත්වාගත යුතු බවටත්, නිර්දේශ කර සිටිමු.

02 නිවැරදි ලකුණු දීමේ පරිපාටියක් සකස් කොට එය මානව හිමිකම් කොමිෂන් සභාව වෙත දින 30 ක් තුළ ඉදිරිපත් කරන ලෙසටද දැනුම් දෙනු ලැබේ.

2025. 07 . 30 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරු වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක කර ඉදිරිපත් කිරීමට නියමිත දින සිට සතියක කාලයක් තුළ මෙම නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින් ද කොමිෂන් සභාවට දැනුම් දියයුතු වන අතර එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සළකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

එල්.ටී.බී. දෙහිදෙණිය,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී. පුංචිහේවා,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

නිමල් ජී. පුංචිහේවා
ජ්‍යෙෂ්ඨ නීතිඥ
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත : 01.විජිත හේරත් මහතා,
ගරු අමාත්‍යතුමා,
වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශය.

02.එම්.එම්.පී,කේ මායාදුන්නේ මහතා,
ලේකම්,
වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශය.